# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2304/10 – 2022 ඔක්තෝබර් 31 වැනි සඳුදා – 2022.10.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2022 අංක 150 දරන ආඥාව**

*මගේ යොමු අංකය:* 4-3/15/2017/VE/354.
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:* BU/LN/1/1/36.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම්, අත්කර ගැනීමේ නිලධාරියාට *නැතහොත්*, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

**හරින් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2022 ඔක්තොබර් මස 05 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

1. **ඉඩම අත්කර ගැනීමේ නිලධාරියා.** – ප්‍රාදේශීය ලේකම්, බුලත්සිංහල.

2. **ඉඩමේ විස්තරය.**– බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තැන්නහේන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Ka/BLT/18/48 සහ 2018.03.02 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'B' – හිල්ස්ට්‍රීම්වත්ත (අරඹහේන කොටස) – ප්‍රමාණය: හෙක්. 4.2917**
උතුරට: හිමිකම් කියන්නා සොයාගත නොහැකි අරඹහේන, ඇළ සහ කේ. එම්. යසලාල් පුෂ්පකුමාර හිමිකම් කියන අරඹහේන; නැගෙනහිරට: කේ. එම්. යසලාල් පුෂ්පකුමාර හිමිකම් කියන අරඹහේන සහ කැබලි අක්ෂර C; දකුණට: කැබලි අක්ෂර C සහ මාර්ගය; බටහිරට: මාර්ගය.

02. **කැබලි අක්ෂර 'C' – හිල්ස්ට්‍රීම්වත්ත (අරඹහේන කොටස) – ප්‍රමාණය: හෙක්. 7.0395**
උතුරට: කැබලි අක්ෂර B, කේ. එම්. යසලාල් පුෂ්පකුමාර හිමිකම් කියන අරඹහේන, කපන ලද කානුව සහ සුනිල් වික්‍රම හිමිකම් කියන අරඹහේන; නැගෙනහිරට: මාර්ගය; දකුණට: මාර්ගය; බටහිරට: මාර්ගය, කැබලි අක්ෂර B, කේ. එම්. යසලාල් පුෂ්පකුමාර හිමිකම් කියන අරඹහේන, කපන ලද කානුව සහ සුනිල් වික්‍රම හිමිකම් කියන අරඹහේන .

EOG 10 - 0304